**හපුතලේ නගර සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.62,851 ක් වූ සේවක ඇප තැන්පත් වගකීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු මුළු ණය වටිනාකම රු.14,681,621 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන වල රු. 15,164,017 ක් ලෙස දැක්වීම හේතුවෙන් වගකීම් රු.482,396 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු ආයෝජන පොලී රු.1,131,958 ක් වුවත්, එය රු.992,886 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් පොලී ආදායම රු.139,072 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.246,200 ක් ගිණුම්ගත නොකිරීමෙන් ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.13,319,106 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 29 ක් කල්පසු වූ හිඟහිටි වරිපනම් ඇතුළුව රු.429,308 ක්,වර්ෂ 29 ක් කල්පසු වූ හිඟහිටි වෙනත් ආදායම් ඇතුළුව රු.12,855,822 ක් වර්ෂ 03 ක් කල්පසු වූ අගරු චෙක්පත් රු.33,976 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 29 ක් කල්පසු වූ වියදම් ණයහිමියෝ රු.2,173,846 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.33,976 ක් වූ ගිණුම් විෂයයක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **අනුකූල නොවීම්**

1.3.4.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 189,486 | 33,976 | අගරු චෙක්පත් 05 කට අදාල මුදල්, වර්ෂ 14ක සිට අයකර ගෙන නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 371 | 283,643 | අවස්ථා 16 කදී දෙන ලද අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 571 | 427,811 | කල් ඉකුත් වූ තැන්පතු ශේෂ 9 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | වාහන 10 ක ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | | නිලධාරින් නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. |
| (ඈ) | | 2002 දෙසැම්බර් 28 දිනැති IAI/202/02 අංක දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | | පරිගණක හා පරිගණක උපාංග වෙනුවෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 586,514 | වාහන 12 ක් සඳහා රක්ෂණ නියෝජිතයන්ගේ මාර්ගයෙන් රක්ෂණ ආවරණ ලබාගෙන තිබුණි. |

| (ඊ) | 1986 අප්‍රේල් 01 දිනැති අංක 890 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | සභාවට අයත් බදුල්ල පාරේ පිහිටි නිල නිවාස අංක 1 හා 2 සඳහා 2017 වර්ෂයේ ආර්ථික කුලිය තක්සේරු කර අයකර නොතිබුණි. |
|---|---|---|

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,135,460 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,629,876 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 1,883,484 | 1,843,076 | 1,879,076 | - | 1,868,100 | 1,837,533 | 1,806,410 | 31,123 |
| (ii) කුලී | 12,611,619 | 6,952,528 | 11,347,817 | - | 8,868,300 | 7,716,635 | 9,555,957 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 805,300 | - | 998,287 | - | 837,200 | - | 1,000,284 | - |
| (iv)වෙනත් ආදායම | 2,343,600 | - | 4,408,587 | - | 2,615,700 | - | 2,166,543 | - |
| එකතුව | 17,644,003 | 8,795,604 | 18,633,767 | - | 14,189,300 | 9,554,168 | 14,529,194 | 31,123 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 8.7 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 18.6 ක් විය. රැස්කළ ආදායම තුළ පෙර වර්ෂයන්ට අදාල හිඟ ලැබීම්ද ඇතුළත්ව තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

ඉකුත් වර්ෂයේ සිට පැවත එන හිඟ ජල බදු රු.31,123 ක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

සභාව සතු මාළු කඩය මාසිකව රු.55,317කට බදු දී තිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව වාරික මුදල් අයවීම බදු දුන් පළමු මාසයේ සිට සිදුවී නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.169,949 ක හිඟයක් පැවතුණි.

2.2.5 **වෙනත් ආදායම්**

------------------

පහත කරුණු නිරික්ෂණය විය.

(අ) මස් හා මාළු කඩ ටෙන්ඩර් ආදායම් රැස් කිරීම සියයට දෙකක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි.

(ආ) බස් නැවතුම්පොල වැසිකිළිය 2017 වර්ෂය සඳහා රු.26,417 ක මාසික ගාස්තුවකට බදු දී තිබුණු අතර, 2017 ජූනි මාසයෙන් පසු නිසි පරිදි මාසික බදු අයකරගෙන නොතිබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට රු.167,087 ක් අය වීමට තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවලින් වර්ග අඩියකට රු.100 ක් අයකළ යුතු වුවද, දැන්වීම් පුවරු 04 ක් මඟින් 2017 වර්ෂයට අදාළව රු.141,000 ක් අය කර ගෙන නොතිබුණි.

2.2.6 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් ආයතන වලින් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.183,329 ක් සහ මුද්දර ගාස්තු රු.778,943 ක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කාර්ය සාධනය**

-----------------

නගර සහා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරි සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

---------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින තෙක් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

**(අ) අතිකාල හා නිවාඩු දින වැටුප්**

--------------------------------

2017 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා නිවාඩු දින වල සේවය කිරීම වෙනුවෙන් ඉටු කරන රාජකාරිය සඳහන් නොකර තිබිය දී සභාවේ කාර්ය මණ්ඩලයට රු.213,908 ක් ගෙවා තිබුණි.

**(ආ) නිවාඩු දින සේවය කිරීම සඳහා පූර්ව අනුමැතිය**

----------------------------------------------------

2013 ඔක්තෝබර් 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2013 (ආ) හා (ඇ) අනුව පූර්ව අනුමැතිය මත ලිත් මසකට උපරිම දින දෙකක් සේවය කළ හැකි අතර දින 02 කට වඩා වැඩියෙන් සේවය කර තිබුණු අවස්ථාවල පූර්ව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) **අනවසර ඉදිකිරීම්**

--------------------

(i) 1988 නගර සභා ආඥා පනතේ 255 වන අධිකාරයේ 72, 73 හා 74 වගන්ති වලට පටහැනිව සිදුකරනු ලබන ඉදිකිරීම් 11 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ii) සභාවේ අවසරයකින් තොරව හපුතලේ පිහිටි හෝටලයක තුන්වන මහල හා වැලිමඩ පිහිටි හෝටලයක දෙවන හා තෙවන මහල් ඉදිකිරීමේ කටයුතු සිදුකරනු ලබන බව 2017 සැප්තැම්බර් 11 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී අනාවරණය වුවද, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා නගර සභාව ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) අනුමැතියකින් තොරව ඉදි කරන ලද තොග වෙළඳපොල අංක 22 කඩ කාමරයට යාබදව අනවසරයෙන් ඉදිකර ඇති ගොඩනැගිල්ල නගර සභා ආඥා පනතේ72(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කඩා ඉවත් කර නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

(අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 11 ක් හා අතිරික්ත 02 ක් පැවතිණි.

(ආ) **සේවක ණය**

---------------

සභාවේ සේවයේ නියුක්තව සිට ස්ථාන මාරුවීම් ලැබූ සේවය හැර ගිය හා මියගිය සේවකයින් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 50,422 ක් අයකරගෙන නොතිබුණි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

2017 දෙසැම්බර් 31 දිනට කඩකුලි තක්සේරුව පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.5. **වත්කම් කළමනාකරණය**

----------------------------

3.5.1 **වාහන අලුත්වැඩියා සිදු නොකිරිම.**

-------------------------------------

2017 ජුනි 30 දින වන විටත් ක්‍රියා විරහිතව පැවති සභාවට අයත් මෝටර් රථයක් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

මාර්ග තලන යන්ත්‍රයක් 2002 වර්ෂයේ සිට පාවිච්චියට ගත නොහැකි තත්වයට පත්ව තිබුණු අතර, එම යන්ත්‍රය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.6 **ප්‍රසම්පාදනය**

--------------

3.6.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4.2 මාර්ගෝපදේශය අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් විෂයයන් 06 ක විචලනය සියයට 10 සිට සියයට 256 දක්වා වු පරාසයක විචලනයක් සහ වියදම් විෂයයන් 07 ක සියයට 04 සිට සියයට 39 දක්වා වු පරාසයක

විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4**.2 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2017 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු ප්‍රමාණවත් පරිදි පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර,පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ගිණුම් ශේෂයන් උපලේඛන සමඟ නොසැසඳීම. |
| | | (ii) | ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම හා අඩුවෙන් දැක්වීම. |
| (ආ) | ආදායම් පාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පහල මට්ටමක පැවතීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් | (i) | සභාව සතු ඉඩම් ගොඩනැගිලි තක්සේරු නොකිරීම. |
| | | (ii) | වත්කම් වර්ගීකරණය නොකිරීම. |
| (ඈ) | තොග පාලනය | (i) | තොග ලේඛන විධිමත්ව නඩත්තු නොකිරීම. |